


# මා තුජේ සලාම් ! Ma thuje salam!
# මැණියනි, ඔබට නමස්කාර වේවා!




## This photograph won Gold Award

This picture by **Hindustan Times** photographer **Himanshu Vyas** has won the IFRA Gold Award for News Photography. Vyas had heard about an orphan fawn being looked after by a Bishnoi woman near his hometown Jodhpur. At the mud dwelling, he noticed the fawn playing with her children.

" When hungry, the woman breastfed the fawn and her daughter simultaneously. Wildlife activism is publicised around the world. But this connect between man and nature is unparalleled," he says.



**මෙ**ම ඡායාරූපය වචන දහස් ගණනක්කින් ද කියනු බැරි මාතෘත්වයේ උත්තම ගුණය හදවත තුළටම විදහා පාන්නකි. මවකගේ සෙනෙහසේ සීමාවක් නැති බව ලොවට පහදා දෙන්නට මෙයට වඩා තවත් සාක්ෂි කුමට ද?

ගිය මස ඉන්දියාවේ හින්දුස්ථාන් ටෛම්ස් පත්‍රයේ ඡායාරූප ශිල්පී හිමන්සු ව්‍යාස් ගත් මෙම දුර්ලභ ගණයේ ඡායාරූපයට ප්‍රවෘත්ති පත්‍ර කැමරාකරණයට හිමිවන **IFRA** ස්වර්ණ සම්මානය ලැබිණ. තම ජෝඩ්පූර් නම් ගමේ වෙසෙන බිෂ්නෝ ගෝත්‍රයට අයත් කාන්තාවක් අනාථ වූ මුව පැටවෙකු ඇති කරන බවට ලද ආරංචිය අනුව එහි ගිය හිමන්සු දුටුවේ එම ගෝත්‍රික තරුණ මවක් තම ළදරු දියණියට කිරි දෙන අතර බඩගිනිවී ඇය ළඟට දුව ආ මුව පැටියාටද ඇය අනෙක් තනයෙන් කිරිපොවන සැටිය. මෙම මුව පැටියාගේ මව වන මුවදෙන ගමේ කිසියම් පිරිසක් විසින් මරා කන ලද බව ද ආරංචි විය. මේ කාන්තාව දැන් මේ අනාථ පැටියාට මව වී සිටින්නීය. දහසක් වන සත්ව පුවත් හා ඡායාරූප ලොව පුරා මාධ්‍යයේ පළවෙතත් තිරිසනුන් හා මනුෂ්‍යයන් අතර මෙවැනි දාරක සම්බන්ධතාවක් අසාමාන්‍යයි හිමන්සු කියයි. මෙම ඡායාරූපය හින්දුස්ථානි ටෛම්ස් පත්‍රයේ පළවූයේ **මා තුජේ සලාම්** යන හින්දි භාෂා සිරස යටතේය. එහි අදහස " මැණියනි ඔබට නමස්කාර වේවා! " යනුයි. ඊට වඩා ගැලපෙන පාඨයක් තවත් තිබිය හැකිද?

**මිහිමඬලේ**
**අඳුරු කුසේ**
**දිය උල්පත අම්මා**
**අහස් තලෙන්**
**මරු කතරට**
**වහින වැස්ස අම්මා**



## මාතෘ පාදං නමා මහං

සොඳුර ගුණෙන් සත් සිඳුටත් ඉහළින් නැති නිම්මා
ගෙදර එකළු කර වැඩ සිටි අප සම්බුදු සම්මා
බි ඳැ ර තැවුල් සුතනන් සිත් හෙවූ නොහිමි පෙම්මා
අ ද ර බැතින් පාද වඳිමි නිති සිහිකර අම්මා

හ ස රැ ල් නැගි සිරි මුහුණින් පොබ කළ සිත් තුටිනී
පි පි ම ල් වැනි දරුවන් මැද නෙළුමක් විය රුචිනී
ළ තැ වු ල් නැති යෞවන විය ඔබෙ සෙනෙහෙන් පිරුණි
නැතිකල් ඔබ මගෙ දුක කාහට කියම්ද මව්නී

ගුරු මාතාවක් වුණි ඔබ දහසක් සිසු පිරිසේ
ගරු කටයුතු ලෙස ලෝකෙන් ලද සැලකිලි බොහොසේ
ද රු වෙකු ලෙස පිළිපදිමින් ඔබෙ ඔවදන් මිණිසේ
ස රු විය දිවි එද ඔබ නැති දුක ඇත නොනිමෙන සේ

සි ත බිඳි කල ඔබ ඔවදන් ඔසුවකි සිත සදනා
නැත අද ඔබ වැනි කිසිවෙක් සෙනෙහැති මට පෙනෙනා
ම තු උපදින හැම වාරෙක ඔබ මගෙ මව ලෙසිනා
ම ට හමුවේවා සැම දුක ඔබ දුටු කල නිවෙනා

♦ ***සිසිර චන්ද්‍රසේකර*** **London**